# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

රත්මලාන ශ්‍රී ලංකා ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස මධ්‍යස්ථානය

**ආධුනිකයින් ඇතුළත් කර ගැනීම - 2026 වර්ෂය**

රත්මලාන ශ්‍රී ලංකා ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස මධ්‍යස්ථානයට 2026 වර්ෂය සඳහා ආධුනිකයින් ඇතුළත් කර ගැනීම පිණිස මෙහි දෙවන ඡේදයේ සඳහන් අවම සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2. *අවම සුදුසුකම් :*

(අ) වයස :- 2026.02.02 දිනට අවුරුදු 16ත් 25 ත් අතර විය යුතු ය.

(ආ) අධ්‍යාපන සුදුසුකම් :- භාෂාව (සිංහල/දෙමළ/ ඉංග්‍රීසි) ගණිතය සහ විද්‍යාව ඇතුළුව විෂයයන් 06ක් ඕනෑම විෂයන් හතරකට සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරක දී අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වීම.

***සැලකිය යුතුයි -*** සියලුම අයදුම්කරුවන් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ ඊට පෙර මෙම සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

3. *පුහුණු පාඨමාලා :*

පහත වෘත්තීය පාඨමාලා 04 සඳහා ආධුනිකයින් 75 දෙනෙකු තෝරාගනු ලබන අතර, එසේ තෝරාගනු ලබන ආධුනිකයින්ට එම වෘත්තීන් යටතේ වසර 03ක ආයතනික සහ වැඩබිම් පුහුණුවක් හැදෑරීමට අවස්ථාව ලැබේ. පාඨමාලාව පවත්වනු ලබන්නේ සිංහල මාධ්‍යයෙන් පමණි.

| | | | |
|---|---|---|---|
| (I) | ඩීසල් එන්ජින් යාන්ත්‍රික ශිල්පී | - (N.V.Q.Level 04) | - 15 |
| (II) | පෑස්සුම් ශිල්පී | - (N.V.Q.Level 04) | - 15 |
| (III) | විදුලි ශිල්පී බල | - (N.V.Q.Level 04) | - 30 |
| (IV) | යන්ත්‍ර ශිල්පී | - (N.V.Q.Level 04) | - 15 |
| | | | 75 |

4. *අයදුම්පත් :*

අයදුම්කරුවන් විසින් මාර්ගගත අයදුම්පත හා මේ සමග ඇති ආකෘති පත්‍රය අනුව මි.මී 297x210(A-4) ප්‍රමාණයේ සුදු කඩදාසියක පිළියෙල කරගත් අයදුම්පත්වල සම්පූර්ණ විස්තර නිවැරදිව සඳහන් කළයුතු අතර, අයදුම්පත් නිවැරදිවත්, සම්පූර්ණයෙනුත් පුරවා එවිය යුතු යි. සම්පූර්ණ නොවන අයදුම්පත් හෝ මුදල් ගෙවූ කුවිතාන්සිය අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5. *පාඨමාලා සඳහා තෝරා ගැනීම :*

(1) ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ මගින් පාඨමාලා සඳහා තෝරා ගැනීම සිදුකරන අතර, අවශ්‍ය අවම සුදුසුකම් ඇති හා 07 වන ඡේදයේ සඳහන් විභාග ගාස්තු ගෙවා ඇති අයදුම්කරුවන් පමණක් ලිඛිත පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

(2) ලිඛිත පරීක්ෂණය ගණිතය, මූලික කාර්මික දැනුම, සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය පදනම් කරගෙන පැවැත්වේ. ලිඛිත පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලැබූ අයදුම්කරුවන් පමණක් ප්‍රායෝගික පරීක්ෂණයකට කැඳවනු ලැබේ.

(3) ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණවලින් එක් එක් පාඨමාලාවට අදාළව වැඩිම මුළු ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් එම පාඨමාලාව සඳහා තෝරාගනු ලැබේ.

6. *විභාග මාධ්‍ය :* පාඨමාලාව පැවැත්වෙන භාෂා මාධ්‍යයෙන් විභාගය පැවැත්වේ.

7. *විභාග ගාස්තු :*

මෙම විභාගය සඳහා ආපසු නොගෙවනු ලබන රු. 2,000/- විභාග ගාස්තුවක් අය කෙරේ. දුම්රිය සාමාන්‍යාධිකාරිගේ මහජන බැංකු නගර මධ්‍ය ශාඛාවේ ගිණුම් අංක 176-1001-2-9027313 ට බැරවෙන පරිදි ඕනෑම මහජන බැංකු ශාඛාවකට ගෙවා ලදුපත හා එහි ඡායා පිටපතක් නොගැලවෙන ලෙස අයදුම්පත සමග අමුණා එවිය යුතු ය. (ලදුපතේ ඡායා පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතු ය.) ලදුපත අමුණා නොඑවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඇතුළත්වීමේ විභාගයට පෙනී නොසිටීම නිසා හෝ වෙනත් කිසියම් හේතුවක් නිසා විභාග ගාස්තු ආපසු නොගෙවන බව සැළකිය යුතු ය.

8. *විභාග මධ්‍යස්ථාන :* ඉහතින් සඳහන් කරන ලද අවශ්‍යතා සම්පූර්ණ කරන අයදුම්කරුවන් සඳහා ලිඛිත පරීක්ෂණයක් රත්මලාන මධ්‍යස්ථානයක දී පැවැත්වෙන අතර, ප්‍රායෝගික පරීක්ෂණය රත්මලාන ශ්‍රී ලංකා ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස මධ්‍යස්ථානයේ දී පැවැත්වේ.

9. *ගිවිසුම අත්සන් කිරීම :* ආයතනයේ පුහුණුවට තෝරා ගනු ලබන සියලුම අයදුම්කරුවන් වෘත්තියට අදාළ කාල සීමාවන් තුළ පුහුණුව සාර්ථකව හදාරන බවට ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සමග ගිවිසුමකට අත්සන් තැබිය යුතු ය.

10. දුම්රිය දෙපාර්තමේන්තුවේ තාක්ෂණික සේවයට බඳවා ගැනීමේ දී ශ්‍රී ලංකා ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස මධ්‍යස්ථානයේ පුහුණුව සාර්ථකව නිමකළ අපේක්ෂකයන්ට

ප්‍රමුඛතාවය දෙනු ලබන නමුත්, පුහුණුවෙන් පසු සියලු ආධුනිකයින්ට රැකියා ලබාදීමට දෙපාර්තමේන්තුව බැඳී නැත.

11. පහත දැක්වෙන ආදර්ශ අයදුම්පත් පෝරමය අනුව අයදුම්පත් පිලියෙළ කර "නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි - (පුහුණු හා මානව සම්පත් සංවර්ධන), ශ්‍රී ලංකා ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස මධ්‍යස්ථානය, කල්දෙමුල්ල පාර, රත්මලාන" වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම්පත්‍රය බහාලන කවරයේ වම්පස උඩ කෙළවරේ "ශ්‍රී.ලං.ජ.දු.කා.අ.ම./2026" යනුවෙන් සඳහන් කළ යුතු ය.

12. සියලු දැනුම්දීම් දුරකථන, වට්ස්ඇප්, විද්‍යුත් තැපැල මගින් පමණක් සිදුවන බැවින් එම දුරකථන අංක හා විද්‍යුත් ලිපිනයන් පැහැදිලිව හා නිවැරදිව දන්වා එවන්න.

13. *අයදුම්පත් භාරගන්නා අවසාන් දිනය :* අයදුම්පත් 2026.02.02 වැනි දින තෙක් භාරගනු ලබන අතර, ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

14. අන්තර්ජාල සම්බන්ධතාවය ලබාගෙන පහත දක්වා ඇති පෝරමය (Google Form) ද පුරවා යොමු කරන්න. https:/docs.google.com/ forms/d/e/ 1FAIpQLScy ZY 5a_hsws7XNhk OZE58RVVQFo6Pzs Tos YkNSf 59I MCZ8Lg/viewform? usb = header

රවීන්ද්‍ර පත්මප්‍රිය,
දුම්රිය සාමාන්‍යාධිකාරී,
ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව,
කොළඹ 10.

### *ශ්‍රී ලංකා ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස මධ්‍යස්ථානයට ආධුනිකයින් බඳවා ගැනීම - 2026*

**කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා**

01. නම සම්පූර්ණයෙන් (වාසගම සහිත) සිංහලෙන් සහ ඉංග්‍රීසියෙන් ලියන්න :

සිංහලෙන් : ……………………………………………………………………………………………

ඉංග්‍රීසියෙන් : ……………………………………………………………………………………………

02. ලිපිනය :

සිංහලෙන් : ……………………………………………………………………………………………

ඉංග්‍රීසියෙන් : ……………………………………………………………………………………………

03. දිස්ත්‍රික්කය : ……………………………………………

04. උපන් දිනය : ……………………………………………

05. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

06. ස්ත්‍රී / පුරුෂ භාවය : ……………………………………………

07. දුරකථන අංකය : (01). …………………………………………… (02). ……………………………………………

වට්ස්ඇප් අංකය/ (WhatsApp):

විද්‍යුත් ලිපිනය (E-mail address) :

08. විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන භාෂා මාධ්‍යය : ……………………………………………

09. *අධ්‍යාපන සුදුසුකම් :*

අ.පො.ස. (සා.පෙළ) විභාග අංකය : ..................... වර්ෂය : ...........................

| *විෂයය* | *ශ්‍රේණිය (පළමුවර)* |
|---|---|
| .............................. | .............................. |
| .............................. | .............................. |
| .............................. | .............................. |
| .............................. | .............................. |
| .............................. | .............................. |
| .............................. | .............................. |
| .............................. | .............................. |
| .............................. | .............................. |
| .............................. | .............................. |
| .............................. | .............................. |

10. ඉල්ලුම්කරන පාඨමාලා අනුපිළිවෙලින් :

I. ..............................

II. ..............................

III. ..............................

IV. ..............................

11. විභාග ගාස්තු ගෙවන ලද ලදුපත මෙහි නොගැලවෙන සේ අයදුම්පතට අමුණන්න.

12. ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත්, මම මෙයින් සහතික කරමි. මෙහි සහතික කරන ලද විස්තරවලින් යමක් අසත්‍ය බව මා තෝරාගැනීමට කලින් පෙනී ගියහොත් එයින් නුසුදුස්සකු වීමටත්, තෝරාගැනීමෙන් පසු පෙනී ගියහොත් පුහුණුවෙන් ඉවත් කර දමනු ලැබීමටත් හැකිවන බව දනිමි.

| | |
|---|---|
| .................................... | .............................................. |
| දිනය | අයදුම්කරුගේ අත්සන |

01 - 27